# සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
## බදාදා

**පළමුවන කියැවීම** **1 තිමෝති 3: 14-16**

ශුද්ධවූ පාවුලු තුමන් විසින් තිමෝතියස් තුමන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

"අපේ ආගමේ අභිරහස ගැඹුරු ය."

ඉක්මණින් ඔබ වෙත එන්නට බලාපොරොත්තු වෙමි. එහෙත් ඔබට මේ අනුශාසනා ලියා එවන්නේ මා ප්‍රමාද වුණොත්, දෙවියන් වහන්සේගේ පවුලෙහි අය කෙසේ හැසිරිය යුතු ද කියා ඔබ දැනගන්නා පිණිස ය. ඒ පවුල වනාහි ජීවමාන දෙවියන් වහන්සේගේ සභාව ය. එය සත්‍යයේ කණුව හා මුල් ගල වේ.

අපේ ආගමේ අභිරහස නිසැක ව ම ගැඹුරු එකකි. ඒ අභිරහස මේ ය. උන් වහන්සේ මිනිසත් බව ගෙන, ආත්මයාණන්ගේ සහතිකය ලබා, දූතයන්ට දිස් වූ සේක. විජාතීන්ට ප්‍රකාශ කරනු ලැබ, ලොව පුරා අදහා ගනු ලැබ, මහිමයෙන් ඔසවනු ලැබූ සේක.

දේව වාක්‍යය එසේය.

# සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
# බදාදා

## පිළිතුරු ගීය ගීතාවලිය 111: 1–6

පිළිතුර: සමිඳුන්ගේ ක්‍රියා කොපමණ උදාර ද?

ගීය: සමිඳුන් පසසන්න. දැහැමියන්ගේ සමාගමේ දී ද
සභාවේ දී ද මාගේ මුළු සිතින් සමිඳුන්ට ස්තුති කරන්නෙමි.
සමිඳුන්ගේ ක්‍රියා කොපමණ උදාර ද?
ඒවාට ප්‍රිය වන සියල්ලෝ ඒවා තේරුම් ගැනීමට උත්සාහ කරති.

එතුමන්ගේ ක්‍රියා ගෞරවයෙන් හා මහිමයෙන් පූර්ණ ය.
එතුමන්ගේ දැහැමිකම සදාතන ය.
උන් වහන්සේ සිය පුදුම ක්‍රියාවන්
අපට අමතක වන්නට ඉඩ නොදෙන සේක.
සමිඳාණෝ දයාවන්ත ය. සානුකම්පිත ය.

එතුමාණෝ තමන් කෙරෙහි ගරු බිය ඇත්තන්ට ආහාර දෙන සේක.
එතුමාණෝ සිය ගිවිසුම කිසි කලෙක අමතක නොකරන සේක.
එතුමාණෝ විජාතීන්ගේ දේශයන් තමන් සෙනඟට දීමෙන්
තමන් බලය ඔවුන්ට පෙන්වූ සේක.

# සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
# බදාදා

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
දෙවියන් වහන්සේගේ පණිවුඩය අප වෙත ගෙනා කල එය මනුෂ්‍යයන්ගෙන් එන පණිවුඩයක් මෙන් නොව දේව පණිවුඩයක් මෙන් පිළිගතිමු.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
මා ඔබට වදාළ වචන ආත්මය ද ජීවනය ද වෙයි.
සදාතන ජීවනයේ වචන ඇත්තේ ඔබ වෙත ය.
ආලේලූයා!

## සාමාන්‍ය සමයේ විසිහතරවන සතිය
## බදාදා

**සුවිශේෂය** **ලූක් 7: 31 – 35**

ලූක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

"අපි ගී ගැයූ විට ඔබ නැටුවේ වත්, අපි වැළපුණ විට ඔබ හැඬුවේ වත් නැත."

ජේසුස් වහන්සේ තවදුරටත් මෙසේ වදාළ සේක. "මේ පරම්පරාවෙහි මිනිසුන් කුමකට සමාන කරම් ද? කුමන දෙයකට මොවුහු සමාන ද? ඔව්හු වනාහි වෙළඳ පොළේ හිඳ ඔවුනොවුන්ට හඬ ගා,

අපි ඔබට නළා පිම්බෙමු. ඔබ නැටවේ නැත.
අපි ඔබට විලාප කීමු. ඔබ හැඬුවේ නැතැ" යි

කියන දරුවන් හා සමාන වෙති. ස්නාවක ජුවාම් නිරාහාරව ද මිදියුසින් තොරව ද සිටි කෙනෙකි. එබැවින් 'ඔහු යක්ෂාවේශ වූවෙකැ' යි ඔබ කියන්නහු ය. මනුෂ්‍ය පුත්‍රයාණෝ කමින් බොමින් ආ සේක. 'බලන්න, ඔහු කෑදරයෙකි. අයකැමියන්ගේත්, පව්කාරයන්ගේත් යහළුවෙකි' යි ඔබ කියන්නහු ය. දෙවියන් වහන්සේගේ ප්‍රඥාව නිවැරදි බව එය පිළිගන්න. සියළු දරුවන් මගින් ඔප්පු වන්නේය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.